නැණ සයුර අධ්‍යාපනික වැඩසටහන
උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
2021(2022 මැයි) අ.පො.ස.(සා.පෙළ.) ඉලක්ක කරගත්
පෙරහුරු පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර අංක -: 02

# 11 ශ්‍රේණිය - බුද්ධ ධර්මය I , II

## බුද්ධ ධර්මය I,II - පිළිතුරු පත්‍රය

## බුද්ධ ධර්මය I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1). | 4 | (11). | 4 | (21). | 1 | (31). | 2 |
| (2). | 3 | (12). | 4 | (22). | 4 | (32). | 3 |
| (3). | 2 | (13). | 3 | (23). | 1 | (33). | 3 |
| (4). | 3 | (14). | 3 | (24). | 1 | (34). | 1 |
| (5). | 2 | (15). | 3 | (25). | 4 | (35). | 1 |
| (6). | 1 | (16). | 2 | (26). | 1 | (36). | 3 |
| (7). | 2 | (17). | 3 | (27). | 4 | (37). | 3 |
| (8). | 1 | (18). | 4 | (28). | 3 | (38). | 1 |
| (9). | 2 | (19). | 1 | (29). | 3 | (39). | 4 |
| (10). | 1 | (20). | 1 | (30). | 3 | (40). | 1 |

## බුද්ධ ධර්මය II

(01).

I . මවුපියන් - හිතමිතුරන්

II. විරමණය - නොකළ යුතු දෙයින් වැළකීම.
සමාදානය - කළ යුතු දෙයෙහි නිරත වීම.

III. ගරුක/ආසන්න/ආචිණ්ණ/කටත්තා

IV. මෙය ඇති කල්හි මෙය වෙයි - මෙය ඉපදීමෙන් මෙය උපදී.

V. කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම.

VI. දානය/ප්‍රියවචනය/අර්ථචර්යාව/සමානාත්මතාව.

VII. විශේෂයෙන් වැඩම කර ධර්මය දේශනා කිරීම.

VIII. පංච අභිඥා/ අෂ්ට සමාපත්ති ලැබීම.

IX. ශාරීරික/පාරිභෝගික/උද්දේශික

X. මහා අටුවා/කුරුන්දි අටුවා/මහාපච්චරි අටුවා

( IX සහ X පිළිතුරු වලට කරුණු දෙකක් දැක්වීමට ලකුණු 1 ක් ද, කරුණු තුනම දැක්වීමට ලකුණු 2 ක්ද හිමි වේ)

(ලකුණු 2X10 – 20)

(02).

I. මෙත්තා/කරුණා/මුදිතා/උපේක්ෂා

II. මෙත්තා - යනු, හිතවත් බවයි. සෑම දෙනාටම අන් අය කෙරෙහි හිතවත් බවක් ඇතිකර ගත යුතු ය.
කරුණා - දුකට පත්වූවන්, එයින් මුදවා ගැනීම සඳහා සිතෙහි ඇතිවන අනුකම්පාව.
මුදිතා - අන් අයගේ දියුණුව දැක සතුටට පත්වීම.
උපේක්ෂා - කීර්තිය, ප්‍රශංසාව මෙන්ම නින්දා අපහාස මැදිහත්ව විඳදරා ගැනීමේ ගුණය

III. * සමාජයේ ජීවත්වන සෑම අයෙක් තුළම මෙම විහරණයන් ඇතිකර ගත යුතු බව.
* රාජ්‍ය පාලනයේ දී මෙම ඉගැන්වීම ඉතා වැදගත් ය.
* පුද්ගලිකව තම තමා විසින් ඇති කරගත යුතු ගුණ ධර්මයන් බව.
* සමාජයේ යහපත ඇතිවන ආකාරය පිළිතුරෙන් පෙන්වා තිබිය යුතු ය.
(සමස්ථයක් සේ සලකා ලකුණු දෙන්න)

(03).

I. වසර සියයකට පසු/ වජ්ජිපුත්තක භික්ෂූණ්ගේ දස වස්තුව

II. සබ්බකාමී මහරහතන් වහන්සේ/ කාලාශෝක රජතුමා/ විශාලා මහනුවර අශෝකාරාමය

III. * විනය විරෝධි ක්‍රියා කළ භික්ෂූන්ට නිග්‍රහ කිරීම.
* වජ්ජිපුත්‍ර භික්ෂූන්ගේ දස වස්තුව ප්‍රතික්ෂේප කිරීම.
* මූලික ඇතිකර ගත් විනය නීති ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාම.
* නිකායන්වලට බෙදී යාම.
* පිළිතුරෙන් ධර්මයේ විනයේ සුරක්ෂිත බව ඇති වූ ආකාරය පැහැදිලි විය යුතු ය..
(පිළිතුර කරුණු තුනක් වත් ඇසුරෙන් පැහැදිලි කර තිබිය යුතු ය.)

(04).

I. " නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති
යස්ස අස්සමුඛෝ රෝදං - විපාකං පටිසේවතී"

II. යමෙක් යම් ක්‍රියාවක් කිරීමෙන් පසු තැවෙන්නට සිදු වේද එම විපාකය කඳුළු පිරි දෙනෙතෙන් යුතුව අඬන්නට සිදුවේ ද? එබඳු ක්‍රියා නොකළ යුතු ය.

III. * ධම්ම පදය පිළිබඳව මූලික කෙටි විස්තරයක්
* පුද්ගලයාට සෑම අතින්ම උපදෙස් සපයන ග්‍රන්ථයක් බව
* ගාථා කීපයක අදහස් මුල්කර ගෙන පුද්ගල ජීවිතයට උපදෙස් සපයන ග්‍රන්ථයක් බව.
* පුද්ගල ජීවිතය යහපත්ව පවත්වා ගන්නා ආකාරය දැක්විය යුතු ය.
(පිළිතුර සමස්ථයක් ගැන සිතා ලකුණු දෙන්න.

(05).

I . අනිත්‍ය/ දුක්ඛ/ අනාත්ම (කරුණු දෙකට 01 ලකුණ යි)

II. * අනිත්‍ය යනු වෙනස් වීමයි. ලොව පවතින ජීව, අජීව සියල්ලම මොහොතින් මොහොත වෙනස් වීමට භාජන වන බව.

* සංසාරික පැවැත්ම විමසිලිමත්ව බැලීමේදී දුක් සහිත ය.මිනිසුන් සැපතට කැමති වුවත් අකැමැත්තෙන් හෝ මේ තත්ත්වයට පත් වෙති. දම්සක් පැවතුම් සූත්‍රයේදී මේ බව විස්තර කර ඇති බව.

* අනාත්ම යනු, නොවෙනස්ව පවතින කිසිදු දෙයක් නැති බවයි. මම මගේ කියා කිසිදු දෙයක් නැති බව ආත්මීය වශයෙන් ගත හැකි කිසිදු දෙයක් නැති බව.

III. * මෙම ඉගැන්වීම බුදු දහමේ මූලික ඉගැන්වීමක් බව.

* ලොව පවතින සියලු දේ මෙම ලක්ෂණයට බඳුන්වන බව.

* මම මගේ කියා කිසිදු දෙයක් නැති බව.

* මෙලෙස අවබෝධ වීමෙන් අටලෝ දහමින් කම්පා නොවී කටයුතු කළ හැකි බව.

* ත්‍රිලක්ෂණ අවබෝධය හොඳ පෞරුෂයක් ඇතිකර ගැනීමටත් මධ්‍යස්ථව කටයුතු කිරීමටත් උපකාරී වන බව.

* පිළිතුරෙන් ප්‍රායෝගික වැදගත්කම හෙලිවිය යුතු ය..

(පිළිතුර සමස්ථය ගැන බලා ලකුණු දෙන්න.)

(06).

I . සෝලියස් මෙන්දිස්/ජෝර්ජ් කීට්

II. අනුරාධපුර යුගය/ මහනුවර යුගය/ පොළොන්නරු යුගය

III. * මෙය එක් පුද්ගලයෙකුට කළ නොහැකි බව.

* මේ සඳහා රජයේ විවිධ ආයතන ඇති බව. (පුරා විද්‍යා දෙපාර්තමේන්තුව/සංස්කෘතික ත්‍රිකෝණය).

* මෙම ස්ථානයන්ට අගෞරවයක් වන පරිදි කටයුතු නොකිරීම.

* මෙහි ඇති ඓතිහාසික වටිනාකම අන් අයට කියා දීම.

* මෙම ස්ථාන අපිරිසිදු නොකිරීම.

* ජාතික උරුමයන් රැක ගැනීමේ වටිනාකම පිළිතුරෙන් හෙලි විය යුතු ය.

(මෙම ආදි කරුණු තුනක්වත් පදනම් කරගෙන ලකුණු දීම ප්‍රමාණවත්.)

(07).

I. * අණන සූත්‍රයේ සඳහන් චතුර්විධ සැප අතුරින් පළමු වැන්න බව.

* අත්ථි සුඛය යනු, දැතේ මහන්සියෙන් දැහැමිව උපයාගත් යම් වස්තුවක් ඇතැයි සිතා සතුටු වීම.

* වර්තමාන සමාජයේ සමහර මිනිසුන්ට මෙම සැපය ලබන්නට නොහැකි බව.

* වර්තමාන සමාජයේ සමහර මිනිසුන් අදාර්මික කටයුතු මගින් ධනය උපයන බව.

* තමාගේ මහන්සියෙන් උපයාගත් දෙය පිළිබඳව සතුටුවන්නා අත්ථි සුඛය ලබන බව.

( සමස්තය ගැන බලා ලකුණු දෙන්න.)

II. *. මූලික කරුණු කීපයක් දැක්වීම.

*. බුරුම ජාතික යූ. විනායාලංකාර හිමි වෙතින් රේරුකානේ චන්ද විමල හිමි ලෙස පැවිදි වූ බව.

*. බුරුම රටට වැඩම කර ත්‍රිපිඨකය හා එහි භාෂාව ඉගෙන ගත් බව.

*. උපසම්පදාව බුරුම රටින් ලැබූ බව.

*. සැහැල්ලු පැවැත්මක් තිබූ බව.

*. බොහෝ ග්‍රන්ථ රචනා කළ බව.

*. 1997.07.04 අපවත් වූ බව.

( සමස්තය ගැන බලා ලකුණු දෙන්න.)

III. *. දඹදෙණි යුගයේ මයුරපාද පරිවේනාධිපති බුද්ධපුත්‍ර. හිමියන් විසින් අරහං බුදුගුණය මුල් කරගෙන රචනා කර ඇති බව.

*. මෙම කෘතිය පරිච්ඡේද 34 කින් යුතු අතර මෙම කෘතිය ලිවීමට දෙවන පැරකුම් රජුගේ දේව පතිරාජ ඇමතියා ආරාධනා කර ඇති බව.

*. පරිච්ජේද දෙකකින් දෙවන පැරකුම් සමය විස්තර කර ඇති බව.

( සමස්තය ගැන බලා ලකුණු දෙන්න.)

IV. *. ස්ථූපයේ ආරක්ෂාව සඳහා ඉදිවූ වෘත්තාකාර ගෘහයකි. මෙය චෛතියඝරය නමින් ද හැඳින්වේ.

*. බැතිමතුන්ගේ ආරක්ෂාව සඳහා ද මෙම ගෘහය ප්‍රයෝජනවත් වූ බව.

*. ථූපාරාමය, අම්බස්තලය, ලංකාරාමය ආදී ස්ථූප වටා තිබූ බව එහි ගල්කණු වලින් හෙළි වන බව.

*. පොළොන්නරුවේ හා මැදිරිගිරියේ පිහිටි වටදාගෙවල් කලාත්මක බවින් යුක්ත බව.

( සමස්තය ගැන බලා ලකුණු දෙන්න.)